
ඔබගේ සදාකාලය ඔබ
ගතකරන්නේ කොතැනකද?

# ඔබගේ සදාකාලය ඔබ ගතකරන්නේ කොතැනකද?

එක්තරා විශ්වවිද්‍යාලිය කථිකාචාර්යවරයකු පිළිබඳ කතාවක මෙසේ සඳහන් වේ. දිනක් ඔහු ගම්මානයක ඇවිදින්නට ගොස් අතරමන් විය. ඔහු හතරමං හන්දියකට ආවිට තම බල්ලා සමග යන කුඩා ළමයෙක් සමුවුනේය.



''පුතා, මේ පාර යන්නේ කොහාටද '' කියා ඇසුවාය.''මම දන්නේ නැහැ''. ''අර පාර යන්නේ කොහාටද?'' ''මම දන්නේ නැහැ '' ''අර අනිත් පාර යන්නේ කොහාටද?'' ''මම දන්නේ නැහැ!''. මිනිසා තරහින් කුඩා ළමයට කීවා, ''මෝඩ ළමයා, මොකුත් දන්නේ නැහැ!''කියා. කුඩා ළමය මෙසේ උත්තර දුන්නා,''ඇත්තටම මම එක දෙයක් දන්නවා. මම ඔබ වගේ අතරමං වෙලා නැහැ!'' කියා.

මිත්‍රය, සදාකලයක් ඔබ වෙනුවෙන් තබා තිබෙනවා. ඔබ සදාකාලික ජීවනයට හෝ සදාකාලික විනාශයට යන දෙකෙන් එකක් කරා ගමන් කරමින් සිටින්නෙහිය. ''මේ ගැන මවිත නොවන්න; මන්ද, සොහොන්ගත සියල්ලන්ට



උන්වහන්සේගේ හඬ ඇසෙන පැය පැමිණෙන්නේ ය. එවිට, යහපත කළ අය සදාතන ජීවනය සඳහා උත්ථාන කරනු ලබති; අයහපත කළ අය විනිශ්චය සඳහා උත්ථාන කරනු ලබති.'' (යොහාන් 5:28,29). ඔබ දන්නවද ඔබ



කොතනටද යන්නේ කියා? ඔබ දන්නවද ඔබ ඔබගේ සදාකාලය ගතකරන්නේ කොහෙද කියා? අර කපිකාචර්යතුමා වගේ, ඔබ ජීවිතයේ බොහෝ දේ දැනගෙන ඉන්නවා ඇති; ඒ කෙසේ වෙතත් ඔබ නොදන්නවා විය හැකිය මරණෙන් පසු ජීවිතයේදී ඔබ යන දිසාව.

අපට මරණින් පසු ජීවිතය මගහරින්නට බැරිය. එහෙත්, අපට තෝරාගත හැක අප යන ස්ථානය. ස්වාමින් වහන්සේ මෙසේ පවසනවා:''මම ඔබ ඉදිරියේ ජීවනයත් මරණයත් තබා ඇත්තෙමි....එබැවින් ජීවනය තෝරාගන්න.'' (ද්විතිය 30:19).




දැන්, ඔබගේ ගමනාන්තය වෙනස් කරගැනීමට ඔබ කැමති නම්, මෙලෙසයි, ඔබ සිටින දිසාව සහ සිටින ස්ථානය සොයා ගත යුත්තේ. සොහොනෙන් පසු යන ලෝකයේ ඇති කොටස් දෙකෙන් එකක් නම් ස්වර්ගයය හෝ දේව රාජ්‍යයය. එය ආලෝකයෙන් සහ අලංකාරයෙන් සහ සාමයෙන් සහ ප්‍රීතියෙන් පිරි දේශයකි. එය දෙවියන් වහන්සේගේ අභිමුඛයේ උන්වහන්සේ අප වෙනුවෙන් පිලියළ කර ඇති සෑම රස වින්දනයක්ම ඇති ස්ථානයකි.

හුදෙක් සාමාන්‍ය ජනයාට මෙය ගැන අවබෝධයක් නොමැත. මන්ද බයිබලය මෙසේ සඳහන් කෙරේ, “දෙවියන් වහන්සේට ප්‍රේම කරන්නන් හට උන්වහන්සේ සූදානම් කර



ඇත්තේ කිසිවෙකු කවදාවත් ඇසින් නුදුටු, කණින් නොඇසූ, සිතින් නොසිතූ දෙයකි.’’ (1 කොරින්ති 2:9) දේව රාජ්‍යයේ රහස් දැනගත හැක්කේ කාහටද?” “ස්වර්ගයටත්, පොළොවටත් ස්වාමීන් වන පියාණන්වහන්ස, ඔබ වහන්සේ මේ කරුණු පැණවතුන් හා නැණවතුන් කෙරෙන් ආවරණය කොට, බාලයන්ට අනාවරණය කළ හෙයින් ඔබට තුති පුදමි.’’ (මතෙව් 11:25).

මෙම ‘’බාලයන්ට’’ යි තම දේව රාජ්‍යයට ඇතුල් වියහැකි වන්නේ.(මතෙව් 18:3). එබැවින් ප්‍රියදර මිත්‍රය, ඔබ ඔබගේ මහන්තත්ව කමින් හැරී බැගෑපත්ව යේසුස් ස්වාමින් වෙතට හැරෙනවිට, ඔබවෙනුවෙන් කෙතරම් ශ්‍රේෂ්ඨදේ සදාකලයෙහි තබා ඇත්ද කියා ඔබට වැටහෙනවා ඇත; එම ස්ථානයට යන මාර්ගයද උන්වහන්සේ, ඔබට පෙන්නුම් කරනසේක.



සදාකාලයේ තිබෙන අනෙක් ස්ථානය නම් පාතාලයයි. යේසුස්වහන්සේ ප්‍රතික්ෂේප කරන්නන් සදාකාලයෙන්

සදාකාලයට අධිකලෙස වධාදෙනු ලබන අන්ධකාරයෙන් සහ ශෝකයෙන් පිරි ස්ථානයකි පාතාලය.  මෙම ස්ථානය පිලියළ කරන ලද්දේ යක්ෂයාට සහ උගේ දූතයන්ට ඔවුන්ගේම චරිතය නිසාය; ඔවුන්ගේම දුෂ්ඨකමයි ‘’නිරා ගින්න’’ සාදා ඇත්තේ .(මතෙව් 25:41). මිනිසා යක්ෂයා අනුගමනය කරන්නට තීරණය ගන්නාවිට යක්ෂයාගේ ස්ථානය ඔහුටත් හිමි වෙනවා ඇත: ‘’එකල ඔබ අනුගමනය කෙලේ මේ යුගයේ පවිටු මඟ ය. තවද, අකීකරු අය තුළ ක්‍රියා කරන බලවේගය වන, ආකාශ බලධාරීන්ගේ අධිපතියාට ද ඔබ යටත් ව සිටියහු ය. එකල අපිත් ඔවුන්ගේ ගණයට අයිතිව, මාංසික තෘෂ්ණාවලට වහල්ව ජීවත් වෙමින්, සිතෙත් කයෙත් ආශාවන් පිනවමින්, සෙසු අය මෙන් අපේ ගතිපැවතුම් අනුව දේව උදහසට ලක් වී සිටියෙමු.’’ (එපිස 2:2,3) ‘’දුදනාගේ පව්කම ඔහුට ම මලපතකි; ඔහු සිය පාප දැලෙහි පැටලෙයි.’’ (හිතෝ.5:22). නිරය, “මරණය” කියාද හැඳින්වේ.(එළිදරව් 21:8) පාපය ගෙවන “කුළිය” එයයි.(රෝම 6:23). මානසික තෘෂ්ණාවෙන් හසුරුවනු ලැබීම ‘’මරණය’’ වේ; (රෝම 8:6); කම්සැපෙහි ලොල් වූ තැනැත්තෝ, ජීවත් ව සිටිය දී ම මැරී සිටින්නෝය. (1. තිමෝති 5:6). ක්‍රමක් ක්‍රමයෙන් ඔබව  මරණය මගින් ගිලගනු ලැබේ!



යේසුස් ස්වාමින් මෙලොවට පැමිණ තම ලේ වැගිරීමෙන් උන්වහන්සේ කෙරෙහි අදහමින්, එතුමාණන්ව පිළිගන්නට,




මෙම සදාතනික අධික වේදනා වලින් ගැලවී සදාකාලික ජීවනය ලැබීමට මග සලසයි. මාර්ගයද, සත්‍යයද, ජීවනයද, උන්වහන්සේ වන්නේය. (යොහාන් 14:6) ‘’යමෙක් පුත්‍රයාණන් අදහන්නේ ද ඔහුට සදාතන ජීවනය ඇත. එහෙත් යමෙක් පුත්‍රයාණන් ප්‍රතික්ෂේප කරන්නේ ද ඔහුට ජීවනය නොලැබේ. දේව උදහස ඔහු පිට රඳා පවති යි.’’ (යොහාන් 3:36)

ආදරණීය පාඨකය, ඔබගේ ගමන් පථෙහි නවතින්න. ඔබගෙන්ම අසන්න: ‘’’මම කොහාටද යන්නේ? මරණින් පසු මොන ස්ථානයකටද මා ලඟා වන්නේ ?’’. අදම සහතික කරගන්න ඔබ යන්නේ නිවැරදි දිසාවටය බව.

**යාඥාව:**

**පෙම්බර යේසුස් ස්වාමිනි, ඔබ මගේ ගැලවුම්කරු සහ ස්වාමියා ලෙස මම පිළිගනිමි. කරුණාකර මගේ හදවතට එන්න. මගේ සියලු පාප සෝදා මා ස්වර්ගය (සදාකාල ජීවනය) ලබාගැනීමට සුදුස්සෙක් කරන්න. ආමෙන්.**

**සුවිශේෂ සටහනක්: සදාකාලික දේව රාජ්‍යයේ අලංකාරයෙන් සහ මහිමයෙන් විවිධාකාරවූ බොහෝ දේශයන් ඇත.**

